රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

DGI/Accre/01/006/2024

2023.12.01

**සියලු මාධ්‍ය ආයතන ප්‍රධානීන් වෙත,**

**2024 වර්ෂය සඳහා නිල ජනමාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම.**

ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගරුත්වය ආරක්ෂා කිරීමට හා ඔවුන්ගේ මාධ්‍ය මෙහෙවර බාධාවකින් තොරව කරගෙන යාමට සහයවීම පිණිස රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ජනමාධ්‍යවේදීන්ට ලබාදෙන නිල ජනමාධ්‍ය හැඳුනුම්පත් 2024 වර්ෂය සඳහා නිකුත් කිරීමේ කටයුතු මේ වනවිට ආරම්භ කර ඇත.

02. 2024 වර්ෂය සඳහා නිල ජනමාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීමේ නිර්නායක හා මාර්ගෝපදේශ ඇතුලත් නිවේදනය, අංක 2359/11 හා 2023.11.21 දිනැති රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇත. ගැසට් පත්‍රයේ සඳහන් මූලික නිර්නායක, අවශ්‍ය ලිපි ලේඛන හා පොදු කොන්දේසි කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමුකරන මෙන් ඉල්ලමි.

03. 2024 වර්ෂය සඳහා නිල ජනමාධ්‍ය හැඳුනුම්පත් අවශ්‍ය ඔබ මාධ්‍ය ආයතනයේ ජනමාධ්‍යවේදීන්ගේ නාම ලේඛනය හා උක්ත ගැසට් නිවේදනයේ සඳහන් මාර්ගෝපදේශ අනුව සම්පූර්ණ කරන ලද අයැදුම්පත්, අදාළ ලිපිලේඛන සමග 2024.03.31 ට පෙර රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට යොමුකරන ලෙස කාරුණිකව දන්වමි.

04. පෞද්ගලික මට්ටමින් ඉදිරිපත් කරන අයැදුම්පත් භාරගැනීම හෝ පෞද්ගලිකව අයැදුම්කරු වෙත ජනමාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම හෝ සිදු නොකෙරේ. ජනමාධ්‍ය හැඳුනුම්පත් ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන අයැදුම්පත් එවිය යුත්තේ මාධ්‍ය ආයතනයේ පරිපාලන / මානව සම්පත් අංශය මගින් පමණි.

05. අයැදුම්පත් භාරදීම හා නිකුත් කරන ජනමාධ්‍ය හැඳුනුම්පත් භාරගැනීම සඳහා මාධ්‍ය ආයතනයේ පරිපාලන / මනව සම්පත් අංශය විසින් නිලධාරියකු පත් කළයුතු අතර, අයැදුම්පත් භාරදීමේදී හා ජනමාධ්‍ය හැඳුනුම්පත් භාරගැනීමේදී නම් කරන ලද නිලධාරියාගේ ජාතික හැඳුනුම්පත හා කාර්යාලීය හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය. එම නිලධාරියාට පමණක් මාධ්‍ය ආයතනයට අදාළ සම්පූර්ණ හැඳුනුම්පත් කට්ටලය එකවර නිකුත් කෙරෙනු ඇත.

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.

දු தொ t (+94 11) 2515759
ෆැ பெ f (+94 11) 2514753
ඊ மி e infodept@slt.lk

www.news.lk

06. ප්‍රාදේශීය මාධ්‍යවේදීන් වෙත හැඳුනුම්පත් නිකුත් කිරීමේදී ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ නාම ලේඛනය මාධ්‍ය ආයතන ප්‍රධානියා / බලධරයා විසින් සහතික කර, ගැසට් නිවේදනයේ ප්‍රාදේශීය මාධ්‍යවේදී වර්ගීකරණය යටතේ දක්වා ඇති අවශ්‍ය ලිපි ලේඛන සමග රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට යොමුකළ යුතුය.

07. මාධ්‍ය ආයතනය නිර්දේශ කරන ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන්ට පමණක් ජනමාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කෙරෙනු ඇත. ඒ අනුව, ඔබ මාධ්‍ය ආයතනයේ සක්‍රීය ප්‍රාදේශීය ජනමධ්‍යවේදීන්ගේ නාම ලේඛනය හා අදාළ ලිපි ලේඛන සහතික කර රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙස දන්වමි.

08. මාධ්‍ය ආයතන වරින්වර ඉදිරිපත් කරන නාම ලේඛන හා අයැදුම්පත් සඳහා ජනමාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකෙරේ. නිල ජනමාධ්‍ය හැඳුනුම්පත් ලබාගැනීමට අපේක්ෂිත ඔබ මාධ්‍ය ආයතනයේ සියලු ජනමාධ්‍යවේදීන්ගේ නම් එක් ලේඛනයක් මගින් එක් වරකදී පමණක් ඉදිරිපත් කරන ලෙස දන්වමි.

09. සියලුම අයැදුම්පත් හා නාම ලේඛනයේ සෑම පිටුවක්ම මාධ්‍ය ආයතනයේ ප්‍රධානියා / බලධරයා විසින් ස්වකීය අත්සන හා නිල මුද්‍රාව සහිතව සහතික කළ යුතුය. අසම්පූර්ණ හා නියමිත ලිපි ලේඛන ඉදිරිපත් කර නොමැති අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. ජනමාධ්‍ය හැඳුනුම්පත් ලබාගැනීම සඳහා සම්පූර්ණ කළයුතු අයැදුම්පත සහ අංක 2023/11 හා 2023.11.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය **www.dgi.gov.lk** රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් හෝ **www.news.lk** රජයේ නිල පුවත් වෙබ් අඩවියෙන් බාගත හැකිය. (අදාළ ගැසට් පත්‍රයේ පිටපතක් මේ සමග අමුණා ඇත.)

11. ජනමාධ්‍ය හැඳුනුම්පත් ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන නම් හා අයැදුම්පත් නිර්දේශ කිරීමේදී වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ නම් හා අයැදුම්පත් පමණක් නිර්දේශ කිරීමට කටයුතු කරන ලෙස සියලු මාධ්‍ය ආයතන ප්‍රධානීන් / බලධරයින්ගෙන් කාරුණිකව ඉල්ලමි.

**දිනිත් චින්තක කරුණාරත්න**

**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**

**දිනිත් චින්තක කරුණාරත්න**
**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**
**කොළඹ 05.**